2023
ඔක්තෝබර්

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

**2023 ඔක්තෝබර් මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සුළු වශයෙන් පහත වැටීමක් ද සේවා ක්‍රියාකාරකම්වල ඉහළ යෑමක් ද පෙන්නුම් කරන ලදී.**

**2023 ඔක්තෝබර් මාසයේදී ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය දර්ශකාංක 49.5ක අගයක් වාර්තා කරමින් කඩඉම් මට්ටම කරා ආසන්න විය.** උප-දර්ශක සලකන විට දී, නව ඇණවුම් සහ තොග මිලදී ගැනුම් මෙම මාසයේ දී ඉහළ ගිය අතර, නිෂ්පාදන සහ සේවා නියුක්තිය පහළ අගයක පැවතුණි.

මෙම මාසයේ දී නව ඇණවුම් ඉහළ යෑම සඳහා රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශය දායක වූ අතර, එහිදී සෑම වසරකම මෙන්ම මෙම වසරේ දී ද අනුරූප මාසවල එළඹෙන උත්සව සමය වෙනුවෙන් පවතින ඉහළ ඉල්ලුම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, නිෂ්පාදන පහත වැටීම සඳහා මූලිකවම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ පහත වැටීම හේතු වූ අතර, ඒ සඳහා පැවති අයහපත් කාලගුණික තත්ත්වය යම් ප්‍රමාණයකට හේතු විය. තව ද, බොහෝ ආයතන විසින් සේවක ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම ගැනීම් මගින් වන පුරප්පාඩු සඳහා පමණක් නව බඳවා ගැනීම් සිදු කරන බැවින් සේවා නියුක්තියේ පහත වැටීම තවදුරටත් පැවතුණි. සමස්ත තොග මිලදී ගැනුම් මෙම මාසයේ දී වැඩි වූ අතර, මේ සඳහා උත්සව සමය වෙනුවෙන් සිදු කරන නිෂ්පාදන ඉලක්ක කර ගනිමින් අමුද්‍රව්‍ය තොග රැස් කිරීම හේතු විය. මේ අතර, පෙර මාසයට සාපේක්ෂව 2023 ඔක්තෝබර් මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් පහළ යන ලදී.

| විචලයය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 45.7 | 49.5 | + | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| **උප-දර්ශක** | | | | |
| නව ඇණවුම් | 43.5 | 50.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 44.5 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.5 | 46.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 47.0 | 52.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 49.0 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන කටයුතු සඳහා වූ අපේක්ෂාවන් යහපත් මට්ටමක පැවති අතර, ප්‍රධාන වශයෙන් එළඹෙන උත්සව සමයේ ඉල්ලුමෙහි අපේක්ෂිත ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** **49.5**

**2023 ඔක්තෝබර්**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.4කින් පහළ යමින් 2023 ඔක්තෝබර් මාසයේ දී 48.8ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

ඉන්දියාව, සිංගප්පූරුව සහ රුසියාව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 ඔක්තෝබර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අඩු වේගයකින් වර්ධනය වූ අතර, එක්සත් ජනපදයේ එම අගය කඩඉම් මට්ටමේ පැවතුණි. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 ඔක්තෝබර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්ඇන්පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 නොවැම්බර් 14 වන දිනට*

*[1] එස්ඇන්පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය** **56.2**

**2023 ඔක්තෝබර්**


**සේවා ක්‍රියාකාරකම්හි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 ඔක්තෝබර් මාසයේ දී දර්ශකාංක 56.2ක් වාර්තා කළේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය. කෙසේ වුවද, 2023 ඔක්තෝබර් මාසය තුළ දී නිමකිරීමට නියමිත කාර්යයන් සහ සේවා නියුක්තිය පහළ ගියේය.

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, තොග සහ සිල්ලර වෙළඳාම, අනෙකුත් පෞද්ගලික ක්‍රියාකාරකම් සහ රක්ෂණ යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණ ධනාත්මක වර්ධනයන් හේතුවෙන්, 2023 ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් ද වැඩි වේගයකින් ඉහළ ගියේය. ඒ අනුව, ණය ඉල්ලුමේ සිදු වූ යම් ආකාරයක වර්ධනයත් සමඟ මූල්‍ය සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව ඉහළ ගියේය. තවද, ඔක්තෝබර් මාසය තුළ තොග සහ සිල්ලර වෙළඳාම සහ අනෙකුත් පෞද්ගලික ක්‍රියාකාරකම් යන උප අංශවල ද කැපී පෙනෙන වර්ධනයන් දක්නට ලැබුණි.

2023 සැප්තැම්බර් මාසයේ සිදු වූ සුළු වැඩිවීමෙන් පසු සේවා නියුක්තිය ඔක්තෝබර් මාසයේ දී පහළ ගිය අතර, නිමකිරීමට නියමිත කාර්යයන්ද අඩු වේගයකින් පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.7** | **56.2** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **උප-දර්ශක** | | | | |
| නව ව්‍යාපාර | 55.8 | 58.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 53.4 | 63.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.0 | 45.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 41.1 | 46.2 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 72.3 | 68.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2023 ඔක්තෝබර් මාසයේ දී අඛණ්ඩව ඉහළ ගියේය. බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් එළැඹෙන උත්සව කාලය සහ සංචාරක සමය තුළ තම ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කරන බැව් සඳහන් කරන ලදී. කෙසේ වුවද, ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින්, මෑතදී විදුලි බිල ඉහළ නැංවීම මෙන්ම එකතු කළ අගය මත බද්ද ඉහළ නැංවීමේ යෝජනාව හේතුවෙන් විය හැකි බලපෑම් පිළිබඳව අවධාරණය කරන ලදී.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 ඔක්තෝබර් මාසයේ දී 50.4ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 ඔක්තෝබර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, එක්සත් රාජධානියේ සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අනුව එහි සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 නොවැම්බර් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.